සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 12 | S | I |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

**සාමාන්‍ය පොදු පරීක්ෂණය**

කාලය පැය දෙකයි මිනි. 30

**උපදෙස්**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු නොලැබේ.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ විභාග අංකය ලියන්න.**
- **උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිලිමත්ව කියවන්න.**
- **1 - 60 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරා එය උත්තර පත්‍රයේ උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

01. මෙම වසරේ අගෝස්තු මාසයේ දී CNN ආයතනය විසින් නම් කරන ලද ආසියාවේ සුන්දරම නගර 13 අතරට එකතු වූ ශ්‍රී ලංකාවේ නගරය කුමක් ද ?

    1. ගාල්ල 2. ත්‍රිකුණාමලය 3. මහනුවර 4. කලුතර 5. හික්කඩුව

02. එක්තරා රෝගයක් සඳහා නිපදවන ලද ලොව ප්‍රථම එන්නත කෙන්යාවේ දරුවන් සඳහා එන්නත් කරන ලද බව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2019 සැප්තැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. එම එන්නත හඳුන්වා දෙන ලද්දේ කුමන රෝගය සඳහා ද ?

    1. ඒඩ්ස් 2. පැපොල 3. කුරුළු උණ 4. මැලේරියාව 5. දියවැඩියාව

03. 2019 ලෝක මලල ක්‍රීඩා උළෙලේ දී ලොව වේගවත්ම මිනිසා ලෙස කිරුළ පැළඳී ඇමරිකානු ජාතික කෙටිදුර ධාවන ශූරයා කවු ද ?

    1. කාල් ලුවිස් 2. ක්‍රිස්ටියන් කොලමන් 3. ක්‍රිස්ටියන් ලෙනාඩෝ
    4. ජැක් කොලමන් 5. මයිකල් කොලින්

04. ජගත් කාලගුණික සංවිධානයේ මූලස්ථානය පිහිටා ඇත්තේ,

    1. නිව්යෝර්ක් 2. ජිනීවා 3. වොෂින්ටන් 4. වියනා 5. ටෝකියෝ

05. 2019 සැප්තැම්බර් මාසයේ දී ඇතිවූ ඩෝරියන් නැමති සුළි කුණාටුව ගොඩබිමක් හරහා හමාගිය ලොව වේගවත්ම සුළි කුණාටුව ලෙස වාර්තා විය. එම සුළි කුණාටුව මගින් වැඩිම ජීවිත සහ දේපල සංඛ්‍යාවක් අහිමි වූයේ කුමන රාජ්‍යයකට ද ?

    1. කියුබාව 2. ෆීජි 3. ග්‍රීන්ලන්තය 4. පිලිපීනය 5. බහමාස්

06. දේශගුණ විපර්යාස හේතුවෙන් 2019 වර්ෂයේ දී ලොවට අහිමි වූ ප්‍රථම විශාල ග්ලැසියරය අයිස්ලන්තයට බටහිර දෙසින් පිහිටා තිබිණි. එම ග්ලැසියරය හැඳින්වෙන නම කුමක් ද ?

    1. සින්ටයිස් 2. ඔක්ලහෝමා 3. ඔක්ජොකුල් 4. හොන්ෂු 5. ග්‍රීන්වේල්

07. මෙම වසරේ දී ශ්‍රී ලංකාවට නීති විරෝධී ලෙස අපද්‍රව්‍ය අඩංගු බහලුම් එවීම සම්බන්ධයෙන් එක්තරා රටකට එරෙහිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් එකසත් ජාතීන්ගේ පරිසර සංවිධානය වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇත. එම අපද්‍රව්‍ය බහලුම් අයත් වූයේ කුමන රටකට ද ?

1. එංගලන්තය 2. ජපානය 3. ජර්මනිය
4. ඇමෙරිකා එ. ජනපදය 5. චීනය

08. 2019 ලෝක කුසලාන සීමිත ඕවර ක්‍රිකට් අවසන් මහා තරගයට සහභාගී වූ ක්‍රිකට් කණ්ඩායම් දෙක අයත් රටවල් වන්නේ,

1. ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය 2. එංගලන්තය සහ ඕස්ට්‍රේලියාව
3. බටහිර ඉන්දීය කොදෙව් සහ නවසීලන්තය 4. එංගලන්තය සහ නවසීලන්තය
5. පකිස්ථානය සහ එංගලන්තය

09. 2019 ලෝක කුසලාන සීමිත ඕවර ක්‍රිකට් අවසන් මහා තරගයේ දී විනිශ්චයකරුවකු ලෙස කටයුතු කළ ශ්‍රී ලාංකිකයා කවු ද ?

1. කුමාර් සංගක්කාර 2. කුමාර් ධර්මසේන 3. රසල් ආනර්ල්ඩ්
4. රොෂාන් මහානාම 5. සිදත් වෙත්තමුනි

10. ශ්‍රී ලංකාවේ වර්තමාන යුධ හමුදාපතිවරයා ලෙස කටයුතු කරන්නේ,

1. හැරී ගුණතිලක 2. ශවේන්ද්‍ර සිල්වා 3. ජාලිය නම්මුනි
4. මහේෂ් සේනානායක 5. වසන්ත කරන්නාගොඩ

11. ලොව විශාලතම ජීවියා ලෙස විද්‍යාඥයින් විසින් හඳුන්වන ලද මහා බාධක කොරල් පරය පාරිසරික දූෂණය හේතුවෙන් මියගියට බවට වාර්තා විය. එම මහා බාධක කොරල්පරය පිහිටි සාගරය කුමක් ද ?

1. ඉන්දියන් 2. ඇන්ටාටික් 3. අත්ලන්තික් 4. ආක්ටික් 5. පැසිෆික්

12. ලොව විශාලතම වැසි වනාන්තරයවන ඇමසන් වනාන්තරයෙන් 60% ක ප්‍රමාණයක් අයත් වන්නේ කුමන රටට ද ?

1. බ්‍රසීලය 2. ඉක්වදෝරය 3. පැරගුවේ 4. ආර්ජන්ටිනාව 5. මෙක්සිකෝව

13. මෙම වසරේ (2019) සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ එක්තරා ප්‍රදේශයකින් ඇතින්නියන් හත් දෙනෙකුගේ මළ සිරුරු සොයා ගන්නා ලදී. එම ප්‍රදේශය කුමක් ද ?

1. විල්පත්තු 2. ත්‍රිකුණාමලය 3. සිංහරාජය 4. හබරණ 5. මින්නේරිය

14. විෂය ක්ෂේත්‍ර රාශියක ප්‍රවීණයකු ලෙස ප්‍රකට වූ මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා 2019 සැප්තැම්බර් මාසයේ දී අභාවප්‍රාප්ත වූ අතර එතුමාගේ අන්තිම කැමැත්ත පරිදි ඉතා චාම් කෙටි අවමංගල්‍ය උත්සවයක් පවත්වා ඔහුගේ දේහය පිළිබඳ අවසන් කටයුතු සිදුකරන ලදි. එතුමාගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වූයේ කුමක් ද ?

1. සාහිත්‍ය 2. දර්ශනය 3. වෛද්‍ය විද්‍යාව
4. ඉංජිනේරු විද්‍යාව 5. සංගීතය

15. මෙම වසරේ (2019) සමරනු ලැබූ ලෝක ළමා දිනය වෙනුවෙන් හඳුන්වා දී තිබූ තේමාව කුමක් ද ?

1. සුමිතුරු දැයකින් - දිනවමු දරුවන් 2. හෙට ලොව දිනනා - දරුවන් රැකගමු
3. දරුවන් වෙනුවෙන් - ලෝකය රැකගමු 4. දරුවන් දිනවමු - ලෝකය පුබුදමු
5. සුමිතුරු සෙනෙහසින් - රැකගනිමු දරුවන්


16. 3න් සහ 5න් ඉතිරි නැතිව බෙදිය හැකි ඉලක්කම් දෙකේ සංඛ්‍යා ගණන වන්නේ,

1. 2 2. 3 3. 4 4. 5 5. 6

17. $7.03 \times 10^6$ හි පිළිතුරෙහි ඇති බිංදු ගණන වන්නේ,

1. 2 2. 3 3. 4 4. 5 5. 6

18. බොත්තම්වලින් සකස් කළ රටා 4ක් මෙහි දැක්වේ. මෙම රටාවට අනුව 10වෙනි සැකසුමේ ඇති බොත්තම් ගණන වන්නේ,



1. 60 2. 55 3. 50 4. 45 5. 40

19. කම්හලක සේවකයන් 680ක ගෙන් 60% ක් කාන්තාවන්ය. කාන්තාවන්ගෙන් 25% ක් රාත්‍රි මුර සේවයේ යෙදෙති. රාත්‍රි මුර සේවයේ යෙදෙන කාන්තාවන් ගණන වන්නේ,

1. 108  2. 106  3. 104  4. 102  5. 100

20. සෘජුකෝණාස්‍රයක දිග 18cm ක් ද පළල 15cm ක් ද වේ. දිග, පළල අතර ඉහත අනුපාතයට ඇති වෙනත් සෘජුකෝණාස්‍රයක දිග 24 cm කි. එහි පළල වන්නේ,

1. 21 cm  2. 20 cm  3. 18 cm  4. 17 cm  5. 15 cm


21. පෙරේරා මහතා තම මාසික වැටුපෙන් $\frac{3}{5}$ක් බැංකුවක තැම්පත්කර ඉතිරි මුදලින් $\frac{1}{2}$ක් බිරිඳට දුන්නේය. බිරිඳට දුන් මුදල මුළු වැටුපෙන් කවර භාගයක් ද ?

1. $\frac{1}{5}$  2. $\frac{2}{5}$  3. $\frac{1}{10}$  4. $\frac{3}{10}$  5. $\frac{9}{10}$

22. ආයතනයක පාඨමාලා හදාරණ ළමයින්ගෙන් සිංහල හා ඉංග්‍රීසි පාඨමාලා හදාරණ ළමයි අතර අනුපාතය 7 : 3 වේ. ඉංග්‍රීසි හා දෙමළ පාඨමාලා හදාරණ ළමයි අතර අනුපාතය 2 : 5 වේ. මෙම ආයතනයේ ඉංග්‍රීසි පාඨමාලා හදාරණ ළමයි ගණන 60 නම් දෙමළ පාඨමාලා හදාරණ ළමයි ගණන වන්නේ,


1. 130  2. 140  3. 150  4. 160  5. 170

23. සංඛ්‍යා රටාවට අනුව $x$ හි අගය වන්නේ,




1. 38  2. 40  3. 42  4. 44  5. 46

- **24, 27 ප්‍රශ්න පහත රූපය මත පදනම් වේ. ළමයි කණ්ඩායමක් සෞන්දර්ය විෂය හැදෑරීම පිළිබඳ තොරතුරු එහි දැක්වේ.**





24. චිත්‍ර විෂය හදාරණ ළමයි ගණන මුළු ළමයින්ගෙන් කවර කොටසක් ද ?

1. $\frac{1}{3}$  2. $\frac{1}{4}$  3. $\frac{2}{5}$  4. $\frac{1}{7}$  5. $\frac{2}{9}$

25. නාට්‍ය හා රංග කලාව හදාරණ ළමයි ගණන 9 නම් නර්තනය හදාරණ ළමයි ගණන වන්නේ,

1. 10  2. 12  3. 14  4. 15  5. 20

26. ගිනිකූරු යොදාගෙන සකස් කළ අෂ්ඨාස්‍ර 2ක් මෙහි දැක්වේ. මෙම රටාවට අෂ්ඨාස්‍ර 10ක් සකස් කිරීමට අවශ්‍ය ගිනිකූරු ගණන වන්නේ,



1. 80  2. 79  3. 77  4. 74  5. 71

27. P සමචතුරස්‍රයේ පරිමිතිය Q සමචතුරස්‍රයේ පරිමිතිය මෙන් 4 ගුණයකි. Q සමචතුරස්‍රයේ වර්ගඵලය $9cm^2$ නම් P සමචතුරස්‍රයේ වර්ගඵලය වන්නේ,

1. $12\ cm^2$  2. $36\ cm^2$  3. $64\ cm^2$  4. $108\ cm^2$  5. $144\ cm^2$

- **28, 29, 30 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

  - සුනිල්, චමල්, විමල්, කමල්, අනිල්, සුසිල්, නිමල් යන අය රවුම් මේසයක් වටා වාඩි වී සිටිති.
  - විමල්, සුසිල්ට දකුණු පසින් සිටී. ඔවුන් දෙදෙනා අතර නිමල් සහ චමල් පමණක් සිටිති.
  - විමල් සිටින්නේ සුනිල් සහ චමල් අතරය.
  - අනිල්, සුසිල්ට ළඟින්ම වම් පසින් සිටී.
  - විමල්ට දකුණු පසින් දෙවනුවට කමල් සිටී.

28. චමල්ට ළඟින්ම ඔහුගේ වම් පසින් සිටින්නේ කවු ද ?
    1. සුසිල් 2. නිමල් 3. කමල් 4. විමල් 5. චමල්


29. සුසිල් සහ කමල් අතර සිටින්නේ කවු ද ?
    1. විමල් 2. නිමල් 3. අනිල් 4. චමල් 5. සුනිල්

30. සුසිල්ගේ වම්පසින් තුන් වෙනුවට සිටින්නේ කවු ද?
    1. විමල් 2. නිමල් 3. අනිල් 4. චමල් 5. සුනිල්

31. නියත වේගයෙන් ජලය ගලායන නලයකින්, ජල තටාකයක $\frac{5}{7}$ ක් පිරවීමට පැය 3ක් ගතවේ තටාකයේ ඉතිරි කොටස පිරවීමට ගතවන කාලය වන්නේ,
    1. පැය 1 මිනි. 5 2. පැය 1 මිනි. 9 3. පැය 1 මිනි. 12
    4. පැය 1 මිනි. 15 5. පැය 1 මිනි. 20

- **32, 33, 34 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

සමාන සමචතුරස්‍ර පිරමීඩ දෙකක් අලවා සකස් කළ ඝන වස්තුවක් මෙහි දැක්වේ. එහි ශීර්ෂයකින් කුඩා සමචතුරස්‍ර පිරමීඩයක් කපා ඉවත් කරයි. ඉතිරි ඝන වස්තුව සම්බන්ධයෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




32. එහි දාර ගණන වන්නේ,
    1. 12 2. 14 3. 16 4. 18 5. 20

33. එහි මුහුණත් ගණන වන්නේ,
    1. 7 2. 9 3. 11 4. 13 5. 15

34. එහි ශීර්ෂ (මුළු) ගණන
    1. 6 2. 7 3. 8 4. 9 5. 10

35. ළමයි 5 දෙනෙකුගේ මධ්‍යන්‍ය ස්කන්ධය 32kg කි. මෙම කණ්ඩායමට තවත් ළමයි දෙදෙනෙක් එක් වෙති. ඔවුන් දෙදෙනාගේ ස්කන්ධ සමානය. එම සිසුන් 7 දෙනාගේම මධ්‍යන්‍ය ස්කන්ධය 34kg කි. පසුව එකතු වූ එක් ළමයෙකුගේ ස්කන්ධය වන්නේ,
    1. 16 kg 2. 17 kg 3. 33 kg 4. 35 kg 5. 39 kg

- **ප්‍රශ්න අංක 36 සිට 39 දක්වා ප්‍රශ්න සඳහා පහත විස්තරය ඇසුරින් පිළිතුරු සපයන්න.**




සෙන්ටිමීටර $1\times1\times1$ ප්‍රමාණයේ ඉහත දක්වා ඇති අන්දමේ කුඩා ඝණක 64ක් සවිකර විශාල ඝණකයක් සාදා එම විශාල ඝණකයෙහි සෑම පැත්තම නිල්පාට ආලේප කරන ලදි. නැවත එම විශාල ඝණකය ඉහත අන්දමේ කුඩා ඝණක 64ක් ලෙස වෙන්කරන ලද්දේ නම්,

36. එක් මුහුණතකවත් නිල් පාට ආලේප නොවූ කුඩා ඝණක සංඛ්‍යාව වන්නේ,
    1. 16 2. 12 3. 8 4. 6 5. 4

37. එක් මුහුණතක පමණක් නිල් පාට ආලේප වූ කුඩා ඝණක සංඛ්‍යාව වන්නේ,
1. 14 2. 24 3. 36 4. 40 5. 54

38. මුහුණත් තුනක පමණක් නිල්පාට ආලේප වූ කුඩා ඝණක සංඛ්‍යාව කීය ද ?
1. 16 2. 14 3. 12 4. 8 5. 6

39. මුහුණත් දෙකක පමණක් නිල්පාට ආලේප වූ කුඩා ඝණක සංඛ්‍යාව කීය ද ?
1. 18 2. 24 3. 26 4. 28 5. 30

- **40, 41, 42 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

නිමාලි, අමාලි, ජයලි, දුලානි, නිලානි මිතුරියන් 5 දෙනෙකි. නිමාලි සහ ජයලි ළඟ රතු පාට කුඩ ඇති අතර ඉතිරි අය ළඟ කළු පාට කුඩ ඇත. ජයලි සහ නිලානි සාරි ඇඳ සිටින අතර අනෙක් අය ගවුම් ඇඳ සිටිති. අමාලි සහ නිලානි නිල්පාට තොප්පි පැළඳ සිටිති. එක් අයෙක් තොප්පියක් පැළඳ නොමැති අතර රතු කුඩයක් ඇය ළඟ ඇත. ඉතිරි අය සුදු තොප්පි පැළඳ සිටිති.

40. සාරියක් ඇඳ සුදු තොප්පියක් පැළඳ රතු කුඩයක් අතැතිව සිටින්නේ කවු ද ?
1. නිමාලි 2. අමාලි 3. ජයලි 4. දුලානි 5. නිලානි

41. තොප්පියක් පැළඳ නොමැත්තේ කවු ද ?
1. නිමාලි 2. අමාලි 3. ජයලි 4. දුලානි 5. නිලානි

42. ගවුමක් ඇඳ සුදු තොප්පියක් පැළඳ සිටින්නේ කවු ද ?
1. නිමාලි 2. අමාලි 3. ජයලි 4. දුලානි 5. නිලානි

43. ඇලවෙන කුළුණ පිහිටා ඇති රට කුමක් ද ?
1. ජපානය 2. ඉතාලිය 3. තුර්කිය 4. චීනය 5. ග්‍රීසිය

- **44, 45 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

ජගත් ඔහුගේ මිතුරන්වන ප්‍රදීප්, සාගර සහ අමිල වෙත ගොස් ණයට රු. 50ක් ඉල්ලයි. එවිට මිතුරන් කළ ප්‍රකාශ පහත දැක්වේ.

ප්‍රදීප් :- ඔබ ඉල්ලන්නේ මා ළඟ ඇති මුදලෙහි දෙගුණයට වඩා රු. 30ක් අඩු මුදලකි.

සාගර :- ඔබ ඉල්ලන්නේ මා ළඟ ඇති මුදලෙන් $\frac{1}{3}$ කට වඩා රු. 10ක් වැඩි මුදලකි.

අමිල :- ඔබ ඉල්ලන්නේ මා ළඟ ඇති මුදලට රු. 20ක් වැඩි මුදලෙන් හරි අඩකි.


44. සාගර ළඟ ඇති මුදල කීය ද ?
1. 100 2. 110 3. 120 4. 130 5. 140

45. මිතුරන් තිදෙනා ළඟ තිබූ මුළු මුදල කීය ද ?
1. 200 2. 210 3. 220 4. 230 5. 240

46. SHANI , NIYAS, ASHAN යන නම් පිළිවෙලින් 32146, 46513, 13214 ලෙස කේත කර ඇත්නම් NISHAN යන නමට අදාළ කේතය වන්නේ,
1. 431264 2. 432641 3. 463214 4. 416324 5. 423614


47. ''රතු චතුරස්‍රය'' පිහිටා ඇති නගරය කුමක් ද ?
1. නවදිල්ලිය 2. මොස්කව් 3. කම්පාලා
4. පොම්පියා 5. කයිරෝ


- අංක 48 සහ 49 ප්‍රශ්න සඳහා දිග හරින ලද ඝනක දෙකේ රූප සටහන් දී ඇත. ඒවා නැවත ඝනක ලෙස සකස් කළ පසු පෙනෙන ආකාරය දැක්වෙන රූපය තෝරන්න.

48. 




1. 2. 3. 4. 5.

49. 




1. 2. 3. 4. 5.

50. පහත දැක්වෙන රූපයේ ත්‍රිකෝණ කීයක් තිබේ ද ?



1. 16 2. 14 3. 12 4. 8 5. 6

- ප්‍රශ්න අංක 51 සහ 52 පහත දැක්වෙන ප්‍රස්තාරය මත පදනම් වේ. 1995 - 2004 දක්වා කාලය තුල මෝටර් රථ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක නිපදවන ලද මෝටර් රථ සංඛ්‍යාව




51. පහත දැක්වෙන කුමන වර්ෂයක ඊට පෙර වර්ෂයට වඩා මෝටර් රථ නිෂ්පාදන සංඛ්‍යාවේ විශාලතම වැඩිවීමක් දැක්වේ ද?
1. 1998 2. 1999 3. 2001
4. 2003 5. 2004

52. පහත දැක්වෙන කුමන ප්‍රකාශයක් ප්‍රස්තාරය මගින් නිගමනය කල හැකි ද?
A - මෝටර් රථ නිෂ්පාදනය 1995 - 2004 කාලය තුළ දෙගුණයකටත් වඩා වැඩි වී ඇත.
B - කර්මාන්ත ශාලාවේ වැඩිම මෝටර් රථ නිෂ්පාදනය සිදුව ඇත්තේ 2003 වර්ෂයේදීය.
C - 1996 - 2004 දක්වා එක් එක් වසරක මෝටර් රථ නිෂ්පාදනය ඊට පෙර වර්ෂයේ නිෂ්පාදනයට වඩා වැඩිවී ඇත.
1. A පමණකි. 2. B පමණකි.
3. C පමණකි. 4. A හා C පමණකි.
5. A, B හා C යන සියල්ලම.

53. A - I දක්වා ඇති පියවර 9 කිනි යුක්ත දෙබසෙහි පියවර පහත දක්වා ඇත්තේ නිවැරදි පිළිවෙලට නොවේ. දෙබසෙහි පියවර නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
A - ඉක්මනින්ම යන්න පුළුවන් කොහොම ද ?
B - මාර්ග අවහිරයක් නැත්නම් පැය තුනකින් විතර යන්න පුළුවන්.
C - මාර්ග අංක 6 පාරෙන් යන්නත් පුළුවන් අංක 5 පාරෙන් යන්නත් පුළුවන්.
D - හොඳයි බොහොම ස්තූතියි. මම යන්නම්.
E - කුරුණෑගල සිට කොළඹට ප්‍රධාන බස් මාර්ග දෙකකින් තියෙනවා.
F - කුරුණෑගලින් කොළඹට බස් එකෙන් යන්නේ කොහොමද ?
G - මාර්ග අංක 6 බස් එකෙන් කොළඹට යන්න පැය කීයක් ගන්නව ද?
H - ඒ මොනවා ද ?
I - අංක 6 බස් එකෙන් ඉක්මනින් යන්න පුළුවන්.

1. FCEAHDGBI 2. EHCFAIGDB 3. EFCHIABGD
4. FHCAGIEBD 5. FEHCAIGBD

54. 1990 දී එක්තරා රටක සියළුම බස්රථ රියදුරන්ට, ආසන පටි පැළඳීම අනිවාර්ය විය.
පහත සඳහන් කුමන ප්‍රකාශයෙන් ඉහත දැක්වෙන ප්‍රකාශය නිගමනය කළ හැක්කේ ද ?
1. 1990 ට පෙර කිසිම රියදුරකුට ආසන පටි පැළඳීම අනිවාර්ය නොවීය.
2. 1990ට පෙර සියළු රියදුරන්ට ආසන පටි පැළඳීම අනිවාර්ය විය.
3. ප්‍රථමයෙන්ම ආසනපටි පළඳිනු ලැබූයේ බස් රථ රියදුරන්ය.
4. සියළු බස් රථ රියදුරන් ආසන පටි පැළඳීම අනිවාර්ය කරමින් නීතියක් 1990 දී සම්මත විය.
5. සියළුම රියදුරන් 1990 සිට ආසන පටි පැළඳීම අනිවාර්ය විය.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

- **ප්‍රශ්න අංක 55 පහත ඡේදය මත පදනම් වේ.**

2011 වර්ෂයේ දී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් බටහිර යුරෝපයේ මිලියන 340ක සුවිසල් ජන සංඛ්‍යාවක් යොදාගෙන ශබ්දයේ ආදීනව සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකරන ලදී. එහි ප්‍රතිඵල අනුව ශබ්දය ජීවිතයේ සාමාකාමී බවට අහිතකර ලෙස බලපෑම් ඇති කරන බවත් අධික ශබ්දයේ ප්‍රතිඵලයක් ලෙස හෘදයාබාධවලට ලක්ව වර්ෂයකට මෙලොවින් සමුගන්නා සංඛ්‍යාව පමණක් තුන් දහස ඉක්මවන බවත් හෙලිවී ඇත.

55. ඉහත ඡේදයෙන් දැක්වෙන ප්‍රධාන අදහස වන්නේ,
1. ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්ෂිකව ශබ්ද දූෂණය පිළිබඳ පර්යේෂණ පවත්වන බවය.
2. අධික ශබ්දය අනතුරුදායක බවයි.
3. ශබ්දයේ ආදීනව පිළිබඳ යුරෝපීය රටවල් අවධානය යොමුකර ඇති බවයි.
4. හෘදයාබාධවලට ප්‍රධාන හේතුව අධික ශබ්දය බවයි.
5. බටහිර යුරෝපයේ මිලියන 340ක් අධික ශබ්දය නිසා පීඩාවට ලක්ව ඇත.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

- **ප්‍රශ්න අංක 56, 57 සහ 58 ප්‍රශ්න පහත දැක්වෙන විස්තරය මත පදනම් වේ.**

චන්ද්‍රිකා ඡායාරූප යොදා ගනිමින් ලෝකයේ හරිතවත් බව වෙනස් වූ ආකාරය පිළිබඳව අධ්‍යයනය කර ඇත. ඒ අනුව 1982 සිට 1998 වර්ෂය දක්වා වූ කාලයේදී වෘක්ෂලතා ආවරණයේ වර්ධනයවීමේ ප්‍රවණතාවක් ලෝකය පුරාම පාහේ දැකිය හැකි වී ඇත. එහෙත් අදින් වසර විස්සකට පමණ පෙර එම තත්ත්වය හදිසියේම වාගේ නැවතී ඇත. එතැන් සිට ලෝකයේ වෘක්ෂලතා වැවෙන භූ දර්ශනවලින් 59%ක් පමණ ප්‍රමාණයක දැකිය හැකි වූයේ දුඹුරු පැහැවීමේ ප්‍රවණතාවකි. එය ශාක වර්ධනයේ අඩුවීමකි. මේ තත්ත්වය අධ්‍යයනය සඳහා උක්ත පර්යේෂකයන් ශාකවල රුක් වළලු යොදා ගනිමින් ද ශාක වර්ධනය පිළිබඳ මිනුම් කටයුතු සිදුකර ඇත. එහි දී පෙනී ගොස් තිබෙන ආකාරයට 1998 වර්ෂයෙන් පසුව ගෙවුණු කාලයේ දී ලෝකයේ අධ්‍යයනය කළ ස්ථාන 171ක් අතරින් ස්ථාන 100ක පමණ ශාකවල රුක් වළලුවල පළලෙහි සාමාන්‍යය අඩුවී තිබේ. 1998ට පෙර එවැනි අඩුවීමක් දැකිය හැකිවී නැත. මෙයින් ද ශාක වර්ධනයේ අඩුවීමක් සිදුවී තිබෙන බව තහවුරු වී ඇත.

56. 1. 1998 වර්ෂයෙන් පසු කාලයේ ශාක වර්ධනය අඩුවීමේ ප්‍රවණතාවක් ඇති බව අධ්‍යයන දෙකක් තුළින් අනාවරණය වී ඇති බවයි.
2. වෘක්ෂලතා ආවරණය පිළිබඳ අධ්‍යයනය සඳහා චන්ද්‍රිකා ඡායාරූප බහුලව යොදාගත හැකි බවයි.
3. වෘක්ෂලතා ආවරණය රහිත බොහෝ ප්‍රදේශවල පස සෝදායාම නිසා එම ප්‍රදේශ දුඹුරු පැහැයෙන් දිස්වන බවයි.
4. ශාකවල රුක් වළලු යොදා ගනිමින් ශාක වර්ධනය පිළිබඳ අධ්‍යයනය කල හැකි බවයි.
5. චන්ද්‍රිකා ඡායාරූප සහ රුක් වළලු අධ්‍යයනය කර ශාකවර්ධනය පිළිබඳ ස්ථාන 171කදී පර්යේෂණ සිදුකර ඇති බවයි.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

57. ඉහත ඡේදයට අනුව වඩාත් නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. චන්ද්‍රිකා ඡායාරූපවල දුඹුරු පැහැයෙන් දැක්වෙන ප්‍රදේශවල වෘක්ෂලතා නොවැවේ.
2. 1998 න් පසු වෘක්ෂලතා වර්ධන වේගය වැඩිවීමේ ප්‍රවණතාවයක් ඇත.
3. චන්ද්‍රිකා ඡායාරූපවල දුඹුරු පැහැයෙන් දැක්වෙන ප්‍රදේශවල වෘක්ෂලතා ආවරණය අඩුවීමට හේතුව ලැව්ගිනිවල ව්‍යාප්තියයි.
4. ශාක වර්ධනය පිළිබඳ මැනීම සඳහා ශාකවල රුක් වළලු යොදා ගැනීම.
5. 1998 න් පසු රුක් වළලුවල පළල අඩුවීමට හේතුව වර්ෂාපතනය අඩුවීමයි.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

58. ඉහත ඡේදයට අනුව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. ලෝකයේ වෘක්ෂලතා ආවරණය වෙනස්වී ඇති ආකාරය චන්ද්‍රිකා ඡායාරූප මඟින් පෙන්නුම් කෙරේ.
2. 1998 න් පසු වෘක්ෂලතා ආවරණය අඩුවෙමින් පවතී.
3. චන්ද්‍රිකා ඡායාරූපවල දුඹුරු පැහැයෙන් දැක්වෙන සියළු ප්‍රදේශවල 1998 ට පෙර වෘක්ෂලතා ආවරණය තිබිණි.
4. 1982 සිට 1998 දක්වා කාලය තුල වෘක්ෂලතා ආවරණයේ වර්ධනයක් දැකිය හැක.
5. ශාකවල රුක් වළලුවල පළල අඩුවීම මඟින් ශාක වර්ධනය අඩුවී ඇති බවට නිගමනය කර ඇත.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

- **ප්‍රශ්න අංක 59 සහ 60 යන ප්‍රශ්නවල අනුපිළිවෙළ වෙනස්කරන ලද වාක්‍ය තුනක් ඇතුළත් කෙටි ඡේද පහක් බැගින් දී ඇත. නිවැරදිව ගැළපූ පසු සිදුවීම් අනුපිළිවෙලින් දැක්වෙන ඡේදය තෝරන්න.**

59. A - ජනිත් දිනපතා උදෑසනම කුරුල්ලන්ට කෑමට බත් දෙයි. බත් පිෂ්ඨධාතු අඩංගු ආහාරයකි. දියබත් ඖෂධීය ගුණය සහිත උදෑසන ආහාරයකි.

B - සුනිමල් හා කමල් උසස් පෙළ පන්තියේ ඉගෙනුම ලබති. සුනිමල් දක්ෂ පාපන්දු ක්‍රීඩකයෙකි. කමල් උඩරට නැටුම් ප්‍රියකරයි.

C - තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම රැකියාවක් සඳහා සුදුසුකමකි. සයුරි තොරතුරු තාක්ෂණ විෂය ඉගෙනීමට පාඨමාලාවක් හදාරයි. සයුරි විදේශ රැකියාවක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙයි.

D - ඉසුරිගේ පියා විදේශ සංචාරයකට සහභාගී විය. වෛද්‍යවරයා ඉසුරිගේ පියාට බෙහෙත් දුන්නේය. ඉසුරිගේ පියා අසනීපයෙන් පසුවිය.

E - සංචාරක ව්‍යාපාරය තුළින් රටට විදේශ විනිමය ලැබේ. අයවැය හිඟය පියවීම සඳහා ණය ලබාගැනීමට සිදුව ඇත. වාර්ෂික අයවැයෙන් වැඩි ප්‍රතිශතයක් ආරක්ෂ කටයුතු සඳහා වෙන් කෙරේ.

1. A 2. B 3. C 4. D 5. E

60. A - අධික උෂ්ණත්වයක දී ජලය වාෂ්ප බවට පත්වේ. වර්ෂාපතනය අඩුවීම ශාක වර්ධනය කෙරෙහි අයහපත් ලෙස බලපායි. මෝසම් වර්ෂාව මඟින් වැඩි වර්ෂාපතනයකි ලැබේ.

B - දියවැඩියා රෝගීන්ට සීමා භාවිතය අහිතකරය. දියවැඩියාව ශ්‍රී ලංකාවේ බහුලව ව්‍යාප්තවන බෝ නොවන රෝගයක් බවට පත්ව ඇත. මුදල් ගෙවා වෛද්‍ය පරීක්ෂණ කරවා ගැනීමට සිදුව ඇත.

C - ජලජ ජීවීන් ආහාරයට ගැනීම අනතුරුදායක විය හැක. මුහුදට එකතුවන ප්ලාස්ටික් කුඩා කොටස්වලට බිඳවැටී ජලජ ජීවීන්ගේ ශරීර තුළට ඇතුළුවේ. ලොව පුරා ප්ලාස්ටික් අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් වාර්ෂිකව සාගරයට එකතු වේ.

D - නව යොවුන්වියේ දරුවෝ ෂර්ලොක් හෝම්ස් කථාමාලාව ප්‍රිය කරති. පාසල් පුස්තකාල භාවිතය අඩුවෙමින් පවතින බව පැවසේ. වර්තමානයේ අන්තර්ජාලය මඟින් පොත් කියවීමේ හැකියාවක් ඇත.

E - කාල කළමනාකරණය තුළින් වැඩි වැඩ ප්‍රමාණයක් කළ හැක. අධිවේගී මාර්ග නිසා ගමනාගමනයට අඩු කාලයක් ගතවේ. රජය මඟින් මෝටර් රථ ආනයනය සීමා කර ඇත.

1. A 2. B 3. C 4. D 5. E

**පළමු වාර පරීක්ෂණය - முதலாந் தவணை பரீட்சை – 2019**

**සාමාන්‍ය පොදු පරික්ෂණය - 13 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය**

**பொதுச் சாதாரண பரீட்சை – 2019 தரம் 13 - விடைகள்**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. 1 | 11. 5 | 21. 1 | 31. 3 | 41. 1 | 51. 2 |
| 02. 4 | 12. 1 | 22. 3 | 32. 3 | 42. 4 | 52. 2 |
| 03. 2 | 13. 4 | 23. 4 | 33. 2 | 43. 2 | 53. 5 |
| 04. 2 | 14. 3 | 24. 3 | 34. 4 | 44. 3 | 54. 4 |
| 05. 5 | 15. 1 | 25. 2 | 35. 5 | 45. 5 | 55. 2 |
| 06. 3 | 16. 5 | 26. 5 | 36. 3 | 46. 3 | 56. 1 |
| 07. 1 | 17. 4 | 27. 5 | 37. 2 | 47. 2 | 57. 4 |
| 08. 4 | 18. 2 | 28. 2 | 38. 4 | 48. 3 | 58. 3 |
| 09. 2 | 19. 4 | 29. 3 | 39. 2 | 49. 2 | 59. 3 |
| 10. 2 | 20. 2 | 30. 5 | 40. 3 | 50. 4 | 60. 3 |